සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# ඉතිහාසය

08 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා ලියන්න.

01 අඹන් ගඟ හරහා වේල්ලක් බැඳ එතැන් සිට උතුරු ප්‍රදේශයට ජලය ගෙනයාමට ........................................................... ඇළ කරවන ලදී. ( ඇළහැර / තල්වතු / මිනිපේ )

02 අභයගිරියේ පිහිටි ........................................ ජල ස්නානය සඳහා සැදූ විශාලම පොකුණකි. ( කුට්ටම් පොකුණ / නෙළුම් පොකුණ / ඇත් පොකුණ )

03 උඩරට රාජධානිය අතීතයේ දී ..................................................... නමින් ද හඳුන්වා ඇත. ( ගඟසිරිපුර / කන්දෙනුවර / පුලස්තිපුර )

04 උඩරට රාජධානියේ නව රාජවංශයන් ආරම්භ කරමින් I වන විමලධර්මසූරිය නමින් රජවූයේ ..................................................... ය. ( කොනප්පු බණ්ඩාර / යමසිංහ බණ්ඩාර / කරල්ලියද්දේ බණ්ඩාර )

05 ආසියාවෙන් යුරෝපයට ගෙන ගිය වෙළඳ ද්‍රව්‍ය විකුණු මධ්‍යස්ථානය ලෙස ........................................ නගරය වැදගත් විය. ( ජිනීවා / ෆ්ලොරන්ස් / කොන්ස්තන්තිනෝපල් )

- අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල දක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 අතීතයේ දී භික්ෂූන් වහන්සේලාට බණ භාවනා කිරීම සඳහා සුදුසු වන ලෙස සැදූ උද්‍යාන ආරාමික උද්‍යාන වේ. (     )

07 අනුරපුර යුගයේ මුල්භාගයේ භාවිතා කළ ගඩොල් නූතන ගඩොල් වලට වඩා ප්‍රමාණයෙන් විශාල වේ. (     )

08 I වන විමලධර්මසූරිය රජු දන්තුරේ සටනින් පෘතුගීසීන් පරාජයට පත් කරන ලදී. (     )

09 නායක්කාර් පෙළපතේ ආරම්භක රජු කීර්ති ශ්‍රී රාජසිංහ රජුය. (     )

10 ෆ්ලෝරන්ස් නගරය ඉතාලියේ බිහි වූ වැදගත් වෙළඳ නගරයකි. (     )



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ස්වභාවිකව සුළං බලය යොදාගෙන යකඩ නිස්සාරණය කිරීම පිළිබඳ හොඳම සාක්ෂිය හමුවන ස්ථානය වන්නේ මින් කුමක් ද?

(1) සීගිරියේ දෙහිගහ ඇළකන්ද (2) බලංගොඩ සමනල වැව ප්‍රදේශය

(3) මධ්‍යම නුවරගම් පළාතේ ගල්කඩවල (4) අම්පාර රජගල ප්‍රදේශය

12 පොළොන්නරු අවධියේ සඳකඩ පහනින් ගව රූපය ඉවත් කිරීමට බල පෑ ආගමික හේතුව කුමක් ද?

(1) හින්දු ආගමික බලපෑම් (2) ඉස්ලාම් ආගමික බලපෑම්

(3) බෞද්ධාගමික බලපෑම් (4) බ්‍රාහ්මණ ආගමික බලපෑම්

13 අනුරපුර යුගයේ දී අගනගරයෙන් බැහැර ප්‍රදේශ වල බිහි වූ දාගැබක් පිළිබඳව දැක්විය හැකි හොඳම උදාහරණය වන්නේ මින් කුමක් ද?

(1) ථූපාරාමය (2) අභයගිරිය (3) සේරුවාවිල (5) මහාථූපය

14 දෙවන රාජසිංහ රජු සමඟ ගන්නෝරුවේදී ඇති වූ සටනේ දී පෘතුගීසි සේනාවට නායකත්වය ලබා දුන් සෙන්පතිවරයා කවුද?

(1) පේරෝලෝපේස් ද සූසා (2) කොන්ස්තන්තීනුද සා

(3) දියෝගුදමේලෝ කැස්ත්‍රෝ (4) අපොන්සු පෙරෙයිරා ද ලසර්දා

15 ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම රාත්‍රි භෝජනය නම් වූ විශිෂ්ට සිතුවම කාගේ නිමැවුමක් ද?

(1) මයිකල් ආන්ජලෝ (2) ලියනාඩෝ ඩාවින්චි

(3) ඩොනෙටලෝ (4) රෆායෙල්

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර කුමක් දැයි ලියා දක්වන්න.**

16 ප්‍රමාණයෙන් කුඩා දාගැබ් ආවරණයට සැදූ ගෘහය ................................................... ලෙස හැඳින්වේ.

17 රජරට ශිෂ්ටාචාරයට අයත් කලාත්මක බෝධිඝරය වූ නිල්ලක්කගම බෝධිඝරය පිහිටා ඇත්තේ ................................................................. දිස්ත්‍රික්කයේය.

18 අතීත රාජධානි ආශ්‍රිතව කැසිකිළියෙන් බැහැර වන අප ජලය ඍජුව පොළවට මුදා නොහැර පෙරීමෙන් පසුව පිරිසිදු කර මුදාහැරීම සඳහා පොළොව තුළ ........................................................... මුට්ටි සවි කර තිබුණි.

19 මහනුවර යුගයේ දී බුදු දහමේ හරය මහජනතාවට ගෙනයාමේ මාධ්‍ය ලෙස ............................................. කලාව යොදා ගෙන තිබුණි.

20 ප්ලෝරන්ස් නගරයේ පිහිටා ඇති ................................................ ප්‍රතිමාව ඩොනෙටෙලෝගේ විශිෂ්ටතම නිමැවුමකි.


(ල. 02 × 20 = 40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

**08 ශ්‍රේණිය** **ඉතිහාසය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**




01. (i) A අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ අවසාන රාජධානියයි. එය කුමක් ද? (ල. 02)

(ii) B අක්ෂරයෙන් දැක්වෙන්නේ මහනුවර නගරයට ආරක්ෂාව සැපයූ ගංගාවකි. එය කුමක් ද? (ල. 02)

A



(iii) A පින්තූරයෙන් දැක්වෙන්නේ උඩරට රාජධානියේ අවසාන පාලකයාය. ඔහු නම් කරන්න. (ල. 02)

(iv) උඩරට රාජධානිය සම්බන්ධයෙන් ඔහුගෙන් ඉටු වූ සේවාවන් 02 ක් ලියන්න. (ල. 02)


B



(v) B පින්තූරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද? (ල. 02)

(vi) මෙය කුමන යුගයකට අයත් ඉදිකිරීමක් ද? (ල. 02)

C



(vii) C පින්තූරයේ දැක්වෙන උපකරණය කුමක් ද? එය නිපදවූ තැනැත්තා කවුද? (ල. 02)

(viii) මෙම උපකරණය මගින් හඳුනාගත් නව සොයාගැනීම් 02 ක් නම් කරන්න. (ල. 02)

02 (i) උඩරට රාජධානියට ස්වභාවිකව ආරක්ෂාව සැපයූ පිහිටීම් 03 ක් පහත තේමා යටතේ දක්වන්න.

A ගංගාවක් B කඳු වැටියක් C දුර්ග මාර්ගයක් (ල. 03)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(ii) උඩරට රජවරු හා ඔවුන්ගේ කාර්යයන් සම්බන්ධ පහත දැක්වෙන වගුව වරහන් තුළ දී ඇති තොරතුරු ඇසුරින් සම්පූර්ණ කරන්න.

| රජතුමා | කළ කාර්යයන් |
|---|---|
| (1) .................................................... | බලන සටනේ දී පෘතුගීසීන් පරාජය කිරීම |
| II රාජසිංහ | (2) .................................................... |
| (3) .................................................... | වැලිවිට සඟරජ හිමිගෙන් අධ්‍යාපනය ලැබීම |
| (4) .................................................... | ඉංග්‍රීසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම |

(ල. 04)

( I විමලධර්මසූරිය / 1638 ගිවිසුම / 1766 ගිවිසුම අත්සන් කිරීම / කීර්ති ශ්‍රී රාජසිංහ / රාජාධිරාජසිංහ )

(iii) උඩරට රාජ්‍ය සමයේ වෙළඳාම සිදුවූ ආකාර දෙක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

03. (i) උඩරට ගෘහනිර්මාණ ශිල්පයේ දී වැදගත් තැනක් ලැබුනේ ආගමික ගොඩනැගිලි නිර්මාණයටයි. එලෙස ඉදිකළ ආගමික ගොඩනැගිලි 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) උඩරට සමාජයේ විවාහයන් සිදු වූ ආකාරය එහි පැවති විවාහ ක්‍රම දෙක ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

| විවාහය | සිදු වූ ආකාරය |
|---|---|
| (1) .................................................... | .................................................... |
| (2) .................................................... | .................................................... |

(ල. 04)

(iii) (අ) උඩරට චිත්‍ර ඇඳීමට තේමා කරගත් ජාතක කතා 02 ක් නම් කරන්න. (ල. 02)

(ආ) මහනුවර යුගයේ චිත්‍ර දක්නට ලැබෙන ස්ථාන 02 ක් නම් කරන්න. (ල. 02)

04. (i) මධ්‍යතන යුගය අවසානයේ යුරෝපයේ බිහි වූ විශ්ව විද්‍යාල ඇසුරින් පහත වගුව පුරවන්න.

| රට | විශ්ව විද්‍යාලය |
|---|---|
| A .................................................... | .................................................... |
| B .................................................... | .................................................... |
| C .................................................... | .................................................... |

(ල. 03)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(ii) පහත සඳහන් ප්‍රකාශ අතරින් පුනරුද සමයේ කලා ශිල්ප වල දක්නට ලැබෙන ලක්ෂණ 04 ක් තෝරා ලියන්න.

A - ආගමික මුහුණුවරක් ගැනීම

B - ලෞකිකත්වයට මුල් තැන දීම

C - ස්වාධීනව නිර්මාණ කිරීමට ඉඩක් නොවීම

D - විවිධ ධනවතුන් අනුග්‍රහ දැක්වීම

E - පල්ලිය පමණක් කලා නිර්මාණ වලට අනුග්‍රහ දැක්වීම

F - නිර්මාණය කර්තෘගේ නමින් ම එළි දැක්වීම

G - ආගමික භක්තිය ජනිත කිරීම මූලික අරමුණ වීම

H - රසවින්දනය ඇති කිරීම මූලික පරමාර්ථය වීම (ල. 04)

(iii) ක්‍රි. ව. දොළොස්වන සියවසේ සිට යුරෝපයේ ඇති වූ වෙළඳාමේ දියුණුව පුනරුදයට බලපෑ ආකාරය කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 04)

05 (i) පහත සඳහන් වන්නේ මානවවාදී ගත්කතුවරු බිහි වූ රටවල් තුනකි. එම රටවලින් බිහි වූ ගත් කතුවරු නම් කරන්න.

★ ඉතාලිය A ..........................................................

★ එංගලන්තය B ..........................................................

★ ප්‍රංශය C .......................................................... (ල. 03)

(ii) දේවවරම් වාදය හා මානව වාදය යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි සරලව ලියන්න. (ල. 04)

(iii) පුනරුද සමයේ කලා නිර්මාණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | නිර්මාණයේ නම | නිර්මාණශිල්පියාගේ නම |
|---|---|---|
| A | මොනාලිසා | (1).......................................................... |
| B | ඩේවිඩ්ගේ ප්‍රතිමාව | (2) .......................................................... |
| C | ශාන්ත ජෝන්ගේ ප්‍රතිමා | (3) .......................................................... |
| D | අවසාන විනිශ්චය | (4) .......................................................... |

(ල. 04)

06 (i) පුනරුද යුගයේ ඉදිවූ ගෘහ නිර්මාණවල දැකිය හැකි රෝම ගෘහ නිර්මාණ ශිල්පයට අයත් ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) පහත සඳහන් වන්නේ විශ්වය පිළිබඳ විවිධ මත ඉදිරිපත් කළ විද්‍යාඥයින් දෙදෙනකුය. ඔවුන් ඉදිරිපත් කළ මත ඊට ඉදිරියෙන් ලියන්න. (ල. 04)

A - නිකලස් කොපර් නිකස් ..........................................................

B - ජොහැන්නස් කෙප්ලර් ..........................................................

(iii) වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් පහත සඳහන් විද්‍යාඥයින් විසින් කළ සොයාගැනීම් සඳහන් කරන්න.

A - විලියම් හාවේ ..........................................................

B - වෛද්‍ය පැරසල්සස් .......................................................... (ල. 04)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

07 (i) පහත සඳහන් පුද්ගලයින් අතරින් ආගමික ප්‍රතිසංස්කරණ වලට සම්බන්ධව පල්ලියේ කටයුතු විවේචනය කළ පුද්ගලයින් තිදෙනකු තෝරන්න.

A - ලියනාඩෝ ඩාවින්චි

B - ඉරාස්මස්

C - ඩොනෙටෙලෝ

D - මාටින් ලූතර්

E - ඩාන්ටේ

F - ජෝන්කැල්වින් (ල. 03)

(ii) පල්ලියේ බලයට එරෙහිව නැගී සිටි කණ්ඩායම් හැඳින්වීමට භාවිතා කළ නම් 02 ක් ලියන්න.

(ල. 02)

(iii) පහතින් දක්වා ඇති වචන සටහන උදව් කරගෙන පිළිතුරු සපයන්න.

(1) පුනරුද සමයේ ප්‍රතිමා නෙළීමට භාවිත කළ අමුද්‍රව්‍යයක් සටහනින් තෝරන්න. (ල. 01)

(2) ග්‍රීක රෝම ගෘහනිර්මාණ ශිල්පය පෙන්නුම් කරන ගොඩනැගිල්ලකි. (ල. 01)

(3) දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියෙකි. (ල. 01)

(4) මයිකල් ආන්ජිලෝගේ අග්‍රගන්‍ය ප්‍රතිමා තුනක් දක්වන්න. (ල. 03)

| | | | | | |
|---|---|---|---|---|---|
| | පි | යෙ | ටා | | |
| ඩේ | වි | ඩ් | මෝ | ශා | |
| ර | ශා | කි | සෙ | න් | |
| ෆා | න් | රි | ස් | ත | රෝ |
| යෙ | ත | ග | ශ්‍රී | පී | ම |
| ල් | ගේ | රු | සි | ත | |
| | න් | ඩ | ය | ර | |



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk